# බළන්ගොඩ නගර සභාව

## 2026.04.07 දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2026.04.07**

**වේලාව -පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | එන්.ඩබ්.පී.ටී ජයසේන මැතිතුමා |
| 2.ගරු උප සභාපති | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම් රුමි මැතිතුමා |
| 5.ගරු නාගරික මන්ත්‍රී | එම්.නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6.ගරු නාගරික මන්ත්‍රී | එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7.ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී පේමදාස මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 9.ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රිනී | පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එන්.ඒ.එස් චන්දන මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රී | එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා |
| 14. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා |
| 15. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්. එච්. ඒ. කරුණාරත්න මිය |

**01.පසුගිය 2026.03.10 දිනැති මහ සභාවේ සහ 2026.03.26 දිනැති විශේෂ මහ සභාවේ සභා වාර්තා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාව සඳහා සහභාගී වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.අනතුරුව ගරු සභාපතිතුමා පැවසුයේ ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමාගේ පුතණුවන්ගේ හදිසි අභාවය වෙනුවෙන් සභාවේ මන්ත්‍රී මණ්ඩලයේ සහ කාර්යය මණ්ඩලයේ ශෝකය ප්‍රකාශ කිරීම වෙනුවෙන් විනාඩියක නිශ්ශබ්ද කාලයක් ලබා දෙන ලෙසයි.

ඉන් අනතුරුව 2026-03-10 දිනැති මහා සභා වාර්තාව සහ 2026-03-26 දිනැති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තා බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.මෙහි දී ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් 2026-03-10 දිනැති මහා සභා වාර්තාව සහ 2026-03-26 දිනැති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තා බවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් සභා වාර්තාවල සංශෝධනයන් තිබේදැයි විමසූ අතර, ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ 2026-03-10 දිනැති මහ සභා වාර්තාවේ පිටු අංක 25හි තමාගේ අදහස් දැක්වීමේදී ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා වැනි ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමන්ලාට ගෞරව කරන බව පැවසූ බවත්, නමුත් සභා වාර්තාවේ "ආධුනික නවක මන්ත්‍රීවරුන් ලෙස පිළිගැනීම සම්බන්ධයෙන් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමාට ස්තුතිවන්ත වන බවත්"ලෙස සඳහන් වී ඇති බවත්, ඒ අනුව එය සංශෝධනය කළ යුතු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය පැවසුයේ 2026-03-10 දිනැති මහ සභා වාර්තාවේ පිටු අංක 19හි නගර සභාවේ කාණු පද්ධතිය සකස් කරන ලෙස තමන් යෝජනා කිරීම සම්බන්ධව වාර්තා වී නොමැති බවත් ඒ අනුව එය සංශෝධනය විය යුතු බවත්ය.මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ තමන්ද එහිදී පොදු වැසිකිළි පද්ධතිය නවීකරණය සඳහා සේනක ගුරුසිංහ මැතිතුමාගේ අනුග්‍රහය ලබා ගැනීමට යෝජනා කළ බවත්,එයද වාර්තා වී නොමැති බවත්, ඒ අනුව එය සංශෝධනය විය යුතු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය 2026-03-26 දිනැති විශේෂ මහ සභා වාර්තාවේ පිටු අංක 04හි තමන්ගේ අදහස් දැක්වීමේ අඩුපාඩු පවතින බවත්, එම රථ ගාල සම්බන්ධව යෝජනාව නොවන්නේ බෝතලේට වහල්වී බව සඳහන් කළ නමුත් එය ඇතුළත් නොවී ඇති බවත්, ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා එම යෝජනාවට විරුද්ධ වූ නමුත් එය සඳහන් වී නොමැති බවත් එම කාරණා විශේෂ කාරණා බැවින් සංශෝධනය විය යුතු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී ජේමදාස මැතිතුමා සඳහන් කලේ පසුගිය 2026-03-10 දිනැති මහ සභා වාර්තාවේ පිටු අංක 02හි "සභාවට අයත් අනෙකුත් සුසාන භූමි හතරම මනාව නඩත්තු වුවද " ලෙස සටහන් වී ඇති නමුත් සභා සීමාව තුළ පවත්නා කිසිඳු සුසාන භූමියක් මනාව නඩත්තු නොවන බවත්, එහිදී ප්‍රකාශ කලේ සුසාන භූමි දෙකක් නොව හතරක් පවත්නා බව පමණක් බවත්ය.

මෙහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී කේ.ජී ජේමදාස මැතිතුමා සඳහන් කලේ 1945 සුසාන භූමි ආඥා පනත අනුව දැනට එය සංශෝධනය වී ඇති බවත්, ඒ අනුව පොදු සුසානභූමියක වළක් කැපීමේදී එය කිසිවකු අධීක්ෂණය නොකළද එය අධීක්ෂණය කළ යුතු බවත්, පසුගිය දිනෙක මිනී මැරුමක ඇසින් දුටු සාක්ෂිකරුවෙකු ඝාතනය කර මින්නේරිය ප්‍රාදේශීය සභාවට අයත් සුසානභූමියක වළදමා තිබී ගැටළුවක් වූ බවත්, එසේ සුසාන භූමිවල මිනී වැළලීම් පිළිබඳව විස්තර ලේඛනගතව පැවතිය යුතු බවත්,

එමෙන්ම පසුගිය දිනෙක බුලත්ගම සුසානභූමියේ වළක් කැපීමට සුසාන භූමියේ පාර අයිනේ යොදා ගෙන තිබූ බවත්,එම සුසාන භූමියේ සිටි පුද්ගලයෙකුට එය භාර දී එසේ සිදුවී ඇති බවත්, එසේම සුසානභූමි ආඥා පනත අනුව සෑම පොදු සුසානභූමයකට වටා අඩි 06ක පමණ උසින් යුතු තාප්පයක් හෝ යකඩ වැටක් පැවතිය යුතු බවත්, බුලත්ගම සුසානභූමියේනම් එවැනි තාප්පයක් පවතින බවත්, තමන් දන්නා පරිදි කුමාරගම සුසානභූමියේනම් මිනී වැළලීම වෙනුවෙන් අවසරයක්වත් ලබා ගන්නේ නැති බවත්, එබැවින් සභාව මඟින් සුසානභූමි නියමානුකූලව පවත්වා ගෙන යන බව පැවසිය නොහැකි බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා සඳහන් කලේ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී ජේමදාස මැතිතුමා හිටපු සභාපතිවරයෙක් ලෙස දැනුවත් බැවින් සභා වාර්තාවේ සංශෝධන අවස්ථාවේදී එම කරුණු පමණක් සඳහන් කර පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම් වලදි අවශ්‍ය කරුණු සඳහන් කිරීම සඳහා අවස්ථාව ලබා ගත හැකි බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පැවසුයේ සභා වාර්තාව ලේකම් ,සභාපතිතුමා යන සෑම තැනකින්ම පරීක්ෂා කර පැමිණියද අඩුපාඩු පවතින බවත්, අදදින න්‍යාය පත්‍රයේ 06:03 යටතේ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා ලෙස සටහන් වී ඇති බවත්, දේශපාලන

මතය කුමක් වුවද එතුමා දැනට උප සභාපති බැවින්,තනතුරේ ගෞරවය රැකිය යුතු බවත්, ඒ අනුව එයද සංශෝධනය විය යුතු බවත්, මෙම වැරදි පරීක්ෂා කිරීමක් සිදු නොවන්නේද යන්නත්ය.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමාට වරද පෙන්වාදීම සම්බන්ධව ස්තූතිය පුද කරන බවත්, සිදු වූ අඩුපාඩුව පිළිබඳව විෂය නිලධාරිනිය විසින් තමන් දැනුවත් කළ බවත් ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පවසන ලදී.

**ඒ අනුව 2026-03-10 දිනැති මහ සභාවේ සහ 2026-03-26 දිනැති විශේෂ මහ සභාවේ සභා වාර්තා සංශෝධනයන්ට යටත්ව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- බලංගොඩ නගරයෙන් අන්තර් පලාත් දුර ගමන් සේවා බස් රථ (අලුත් පාර) මොහාන් සාලිය එල්ලාවල මාර්ගයේ ධාවනය කරවීම සම්බන්ධව සීමාසහිත බදුල්ල මගී ප්‍රවාහන සමාගම යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමා සභාගත කරන ලදී.

  එම ලිපිය මඟින් බලංගොඩ නගරයෙන් මාර්ග අංක 99 බදුල්ල - කොළඹ බස් රථ සහ දුර ගමන් සේවා බස් රථ මොහාන් සාලිය එල්ලාවල (අලුත් පාර) මාර්ගයෙන් බස් නැවතුම්පල අසලින් කොළඹ බලා යාමට සහ නැවත එම මාර්ගයෙන්ම බදුල්ල බලා ධාවනයට අවසර ලබා දෙන්නේ නම්, අප බස් රථ සඳහා වැයවන වේලාව නගරය හරහා යාමෙන් විනාඩි 10ක පමණ කාල පරාසයක් ඉතිරි වන බවත්, මගී ජනතාවට අවහිරයකින් තොරව බස් නැවතුම්පලේ සිට අතුරු මාර්ග භාවිතා කරන මගීන්හට එකම ස්ථානයකින් සේවා ලබා ගැනීමට හැකි බවත්, නගරය මැදින් බස් රථ ධාවනයේ දී ඇතිවන මාර්ග තදබදය අඩුවන බවත් දන්වා ඇති බවත් ගරු සභාපතිතුමා පැවසීය.

  අනතුරුව ගරු සභාපතිතුමා මෙම ඉල්ලීම මෙම මස පැවැත්වෙන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන බවත් ඒ අනුව අදාළ ආයතන සමඟ එහිදී සාකච්ඡා කර තීරණයක් ගත හැකි බවත් පවසන ලදී.

  ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ බළන්ගොඩ බස් නැවතුම්පොළින් ගමන් ආරම්භ කරන බස් රථ පොලිසිය අසළ සහ මහජන බැංකුව අසළ බස්නැවතුම්පළවල් වල විනාඩි 30ක පමණ කාලයක් නවත්වා සිටින බවත්, රෝහල වැනි ඉතා කෙටි ගමනකට එම බස්රථ භාවිතා කරන මගීන්ට එය බලපාන බවත්, ඒ සම්බන්ධවද කටයුතු

කළ යුතු බවත්ය.ගරු සභාපතිතුමා පැවසුයේ බළන්ගොඩ ප්‍රවාහන කමිටුව සඳහා එම ගැටළුව ඉදිරිපත් කළ යුතු බවයි.

ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට මෙම ඉල්ලීම් යොමු කිරීමට පෙර මේ සම්බන්ධව සභාවේ තීරණයක් ගෙන ඒ සඳහා යොමු කිරීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා පවසන ලදී.ගරු සභාපතිතුමා පැවසූයේ පසුගිය සභා වාරයේදීද මේ සම්බනධව සාකච්ඡා කළ බවත්, එහිදීද විරුද්ධත්වයක් නොතිබූ බවත්ය.

පසුගිය සභා  වාරයේදී දුර ගමන් සේවා බස් රථ (අලුත් පාර) මොහාන් සාලිය එල්ලාවල මාර්ගයේ ධාවනය කරවීම සම්බන්ධව සිදුකළ සාකච්ඡාවේදී පක්ෂ විපක්ෂ ලෙස අදහස් ප්‍රකාශ වූ බවත්, ඒ අනුව ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය බස් රථ (අලුත් පාර) මොහාන් සාලිය එල්ලාවල මාර්ගයේ ධාවනය කරවීම සුදුසු බවට යෝජනා කළ නමුත් ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා එමඟින් පරණ පාර ව්‍යාපාරික ප්‍රජාවට අසාධාරණයක් වන බව ප්‍රකාශ කළ බවත්, ඒ අනුව දෙපාර්ශවයම පිළිබඳ  සලකා බලා තීරණ ගැනීම සුදුසු බවත් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා පවසන ලදී.

මෙහිදී පළමුව සලකා බැලිය යුත්තේ බස්රථවල ගමන් කරන මඟීන් පිළිබඳව බවත්, දෙවනුව ව්‍යාපාරික ප්‍රජාව පිළිබඳව බවත්, අතුරු මාර්ගවල ගමන් කරන මඟී ජනතාවට බදුල්ල කොළඹ බස්රථවලින් නගරයට පැමිණ කෙලින්ම බස් නැවතුම්පොළින් බස්රථයක් ලබා ගැනීමේ පහසුව ලැබෙන බවත්, තමාගේ අදහස එය බවත්, ඒ අනුව සලකා බලා තීරණයක් ලබා ගන්නා ලෙසත් ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය පවසන ලදී.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ ඉහත ඉල්ලීම් ලිපියෙන් දක්වා ඇත්තේ මඟීන්ගේ පහසුව නොව දුර ගමන් සේවා සඳහා ගතවන කාලය පිළිබඳව බවයි.ගරු සභාපතිතුමා පැවසූයේ එම කරුණු දෙකම පිළිබඳව සඳහන් කර ඇති බවයි.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා පැවසූයේ සභාවේ මන්ත්‍රීතුමන්ලා මේ සඳහා විරුද්ධත්වයක් පවතින්නේ නම් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට යොමු කිරීම අවශ්‍ය නොවන බවත්, සභාවේ මන්ත්‍රී මණ්ඩයේ අදහස් අනුව නගරයේ පළවෙනි පුරවැසියා ලෙස ගරු සභාපතිතුමාට කටයුතු කළ හැකි බවත්, ඉල්ලීම යොමුකර ඇති පාර්ශවයටම එම ඉල්ලීම සම්බන්ධීකරණ කමිටුව වෙත යොමුකළ හැකි බවත්, ඉහත මන්ත්‍රීතුමිය පැවසූ පරිදි පළමුව සලකා බැලිය යුත්තේ මඟී ජනතාව පිළිබඳව බවත්, දෙවනුව අනිකුත් කාරණා පිළිබඳව සලකා බැලිය යුතු බවත්ය.

මේ සම්බන්ධව සාකච්ඡා කිරීමේදී වසන්ත මන්ත්‍රීතුමා ඉතා හොඳ අදහසක් ඉදිරිපත් කළ බවත්, බළන්ගොඩ බේකරි නිෂ්පාදන සම්බන්ධව ජයනක මන්ත්‍රීතුමාගේ ව්‍යාපාරය කීර්තියක් අත්කර ගෙන ඇති බවත්, එබැවින් එම ස්ථානය සොයා යෑමක් තිබූ බවත්, නමුත් දුර ගමන් සේවා බස්රථ පරණ පාර මාර්ගයෙන් ගමන් කරන විටදී එම මඟීන්ට නැවත ත්‍රීරෝද රථයක් රැගෙන බස් නැවතුම්පොළට යාමට සිදුවන බවත්, එබැවින් අලුත් පාරෙන් දුර ගමන් සේවා බස් රථ ධාවනය කිරීම සුදුසු වන මතයේ තමන්ද සිටින බවත් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසීය.

ඉහත ඉල්ලීම මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරිය හරහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත යොමු කිරීම සුදුසු වන බවත්, සභාව මැදිහත්වීමක් අවශ්‍ය නොවන බවත්, එහිදී සිදුකරන සාකච්ඡාවට සභාව මැදිහත්විය හැකි බවත්ය.මෙහිදී ගරු නාගරික මන්ත්‍රී කේ.ජී ජේමදාස මැතිතුමා සඳහන් කලේ මෙය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත යොමු කිරීම කළ යුතු බවත්, මාර්ග සංවර්ධන අධිකාරිය දුර ගමන් සේවා ගමන්මාර්ගය ලෙස නම්කර ඇත්තේ පරණ පාර බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා සඳහන් කලේ නගරයේ රථවාහන පාලනය සම්බන්ධ වගකීම නගර සභාව ගත යුතු බවත්, එහිදී පොලිසිය වුවද අවුරුදු සමයේදී රථවාහන ගමන් කරන මාර්ග පිළිබඳව සභාව සමඟ සාකච්ඡා කර තීරණ ලබාගන්නා බවත්, සභාවට පවතින බලය වෙනත් අයෙකුට ලබා නොදෙන ලෙසත්,එය ගෞරවයත් සමඟ පවතින බවත්, මෙම ඉල්ලීම සිදු කරන්නේ ලංකා ගමනාගමන මණ්ඩලය නොව පුද්ගලික බස්රථ සංගමය මඟින් බවත්, මෙහිදී මෙම බස් රථවලින් නගරය පසුකර යන මඟීන්ට ගැටළුවක් නොවන මෙම නැවතුම් ස්ථාන වලින් බස් රථ වලට ගොඩවන සහ බසින මඟීන් වෙනුවෙන් සලකා බැලිය යුතු බවත්, මේ සම්බන්ධව වෙළඳ සංගමය දැනුවත් කළ යුතු බවත් තමාගේ අදහස වන බවයි.

අනතුරුව ගරු සභාපතිතුමා පැවසුයේ ඉහත සභාවේ දැක්වූ අදහස් පරිදි මෙය පළමුව ප්‍රවාහන කමිටුව වෙත යොමුකර එම තීරණයත් සමඟ සම්බන්ධීකරණ කමිටුව වෙත යොමු කරන බවයි.

- සබරගමුව පළාතේ පාලන ආයතන සතු ගිවිසුම් මඟින් මගින් බදු දී ඇති දේපළ ගිවිසුම්ගත බදුකරු විසින් තෙවන පාර්ශවයන් වෙත අතුරු බදු දී ඇති අවස්ථා ඇති බැවින් එම අතුරු බදුකරුවන් සහ පාලන ආයතන විසින් අතුරු බදු නියමානුකූල කර ගිවිසුම් ගතවීමට 2026.01.01 දින සිට 2026.03.31 දින දක්වා ලබා දී තිබූ මාස 03 ක කාලසීමාව 2026.05.31

දක්වා මාස 02 කින් දීර්ඝ කිරීමට ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලැබී ඇති බව දන්වමින් පළාත් පාලන කොමසාරිස් CLG/LG/5/3/1 අංක දරණ හා 2026.03.10 දිනැති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

- "සුරකිමු ලංකා " ජාතික මෙහෙයුම යටතේ ලබ ශක්ති අර්බුදය කළමණාකරණය සඳහා වන යෝජනා සහ ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව පවත්වනු ලැබූ විශේෂ සාකච්ඡාවේ තීරණ ක්‍රියාත්මක කිරීම යන මැයෙන් පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/AD/2/5/9 හා 2026.03.31 දිනැති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

- බළන්ගොඩ තානායම පිහිටි ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීම හා තාවකාලික කළමණාකරණය හා මෙහෙයුම් කටයුතු සඳහා සභාව වෙත අනුමැතිය ලබාදෙමින් නාගරික සංවර්ධන අධිකාරිය අධ්‍යක්ෂ ජනරාල් යොමුකර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

- නිවාස සංවර්ධන අධිකාරිය සතු අනදමෙත්ගම ප්‍රජාශාලාව බළන්ගොඩ නගර සභාව වෙත පවරාගැනීමට අවශ්‍ය කටයුතු කිරීමටත්, ඉන් අනතුරුව නගර සභාව වෙත සමඟ ගිවිසුම්ගතවීම තුලින් අනදමෙත්ගම නිවාස සංවර්ධන හා සුභසාධක සංගමය වෙත ලබා ගැනීමට කටයුතු කිරීම කල යුතු බවට 2026.02.05 දිනැති සාකච්ඡාව මඟින් තීරණය කළ බව දන්වමින් බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් යොමුකර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ සභා තීරණය පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ එම සමිතිය දැනුවත් කර නොමැති බව පෙනී යන බවයි.ගරු සභාපතිතුමා මෙම ලිපිය පරිදි අදාළ සමිතිය දැනුවත් කරන බව පැවසීය.

- පසුගිය දිනෙක රත්නපුර ප්‍රදේශයේ හදිසි ගිනි ගැනීමක් වෙනුවෙන් පෙ.ව.3.00 සිට ඒ වෙනුවෙන් කැප වී සේවය සඳහා වාර්තා කළ කෝසල,රංග,ධනුෂ්ක, මධුෂංක යන සේවක මහතුන්ගේ සේවය අගය කරන බවත්, ක්ෂණිකව ක්‍රියාකළ බැවින් සිදුවීමට තිබූ විනාශයක් වළක්වා ගත් බවත්,එවැනි හදිසි අවස්ථාවලදී රාජකාරී වේලාව පිළිබඳව නොසලකා ක්‍රියාකිරීම සම්බන්ධව ස්තූතිවන්ත වන බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

**03. සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා**

අසනීප තත්ත්වයක් හේතුවෙන් ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා 2026-04-07 දින මහ සභාවට සහභාගී නොවන බවත්, නිවාඩු අනුමත කර දෙන ලෙසත් යොමු කරන ලද ඉල්ලීම අනුව ගරු සභාපතිතුමන් විසින් එතුමන්ලාගේ නිවාඩු අනුමත කරන ලෙසට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව එකී නිවාඩු ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04. සංදේශ/පැමිණිලි/පෙත්සම්/ආයාචනා ඉදිරිපත් කිරීම**

මෙදින ගරු සභාවේ සංදේශ/පැමිණිලි/පෙත්සම්/ආයාචනා ඉදිරිපත් කිරීම් නොවන බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**05.ටෙන්ඩර්පත් හා මිල ගණන් විවෘත කිරීම.**

මෙදින ගරු සභාවේ ටෙන්ඩර්පත් හා මිල ගණන් විවෘත කිරීම් නොවන බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**06.කල් දී ඇති ප්‍රශ්න**

**06:01** ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා

**06:01:01** පසුගිය මස පවත්වනු ලැබූ සංගීත ප්‍රසංගයේ විනෝද බදු වලින් ලැබූ ආදායම කොපමණද?

ප්‍රචාරක දැන්වීම් පුවරුවලින් ලැබූ ආදායම කොපමණද?

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පැවසූයේ පසුගිය මස 20,21,22 යන දිනයන්හි පවත්වනු ලැබූ සංගීත ප්‍රසංගයේ විනෝද බදු වලින් රු.50,000.00 ක ආදායමක්ද, ප්‍රචාරක දැන්වීම් පුවරුවලින් රු.14,400.00 ක මුදලක්ද ලබාගෙන ඇති බවයි.

**06:01:02** මුගුණමලය මාර්ගයේ නඩත්තු කටයුතු ආරම්භ කරන්නේ කවදාද?

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පැවසූයේ නඩත්තු කටයුතු සම්බන්ධව මෙම දිනවල ගැටළුවක් මතු වී ඇති බවත්, සැපයුම්කරුවන් මෙම දිනවල ඉන්ධන මිල වැඩිවීමත් සමඟ සැපයුම් ද්‍රව්‍ය මිල සංශෝධයක් ඉල්ලා ඇති බවත්, ඒ අනුව ඉදිරියේදී නව මිල ගණන් කැඳවීමේ ක්‍රියාවලියෙන් පසු එම නඩත්තු කටයුතු ආරම්භ කළ හැකි වනු ඇති බවත්ය.

**06:01:03** මිලදී ගෙන ඇති සෝලා විදුලි බල්බ සවි කරන්නේ කවදාද?

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පැවසූයේ මෙම දිනවල එම මිලදී ගත් විදුලි කණු සඳහා අවශ්‍ය පින්තාරු කිරීම් සහ උපකරණ සවිකිරීම් සිදු කරන බවත්, එම කටයුතු

අවසන් වූ වහාම අප්‍රේල් 10වනදා වන විට සෝලා විදුලි බල්බ සවිකිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බවත්ය.

**07. කල් දී ඇති යෝජනා**

**07:01 ගරු සභාපති එන්.ඩබ්.පී.ටී.ජයසේන මැතිතුමා**

**07:01:01** බලන්ගොඩ නගර සභා පුස්තකාලයේ අත්‍යවශ්‍ය අලුත්වැඩියාවන් සිදු කිරීමේ කර්මාන්තයට අදාළ අවසන් බිල්පත සඳහා රු.1,773,337.86 ක මුදල සභාපති, අවිහිංසා සහන සංවිධානය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:02** මාලිගාතැන්න සරස්වතී මාර්ගයේ පැති බැම්ම ඉදි කිරිම කර්මාන්තයට අදාළ අවසන් බිල්පත සඳහා රු.1,257,428.26 ක මුදල සභාපති, මාලිගාතැන්න එකමුතු සුභ සාධක සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:03** බලන්ගොඩ නගර සීමාව තුල කසළ එකතු කිරීමේ ටෙන්ඩරය සඳහා පහත ගෙවීම් සිදු කිරීම වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබා ගැනීම.

2026.03.01 දින සිට 2026.03.15 දින දක්වා රු.625,000.00

2026.03.16 සිට 2026.03.31 දින දක්වා රු.625,000.00

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:04** 2026 වර්ෂය සඳහා සේවකයන් සඳහා උත්සව අත්තිකාරම් රු.1,515,000.00 ගෙවීම වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:05** වර්තමානයේ ඉන්ධන මිල ඉහළ යාම හේතුවෙන් සපයනු ලබන අමුද්‍රව්‍ය මිල ගණන් සංශෝධනය කර දෙන ලෙස තිරණ කන්ස්ට්‍රක්ෂන් ආයතනය ඉල්ලීම් කර ඇත. ඒ අනුව සැපයුම් ද්‍රව්‍ය සඳහා නැවත මිල ගණන් කැඳවීමට සිදු වන බැවින් ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:06** රු.100,000.00 දක්වා වන මිලදී ගැනීම් සඳහා පහත ප්‍රසම්පාදන කමිටුව පත් කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම.

I. එස්.එච්.ඒ කරුණාරත්න මිය (කමිටු සභාපති)
II. එම්.ජී.එස් ගුණවර්ධන මිය (පළමු සාමාජික)
III. ඊ.ජී.ඒ.සී හේමපාල මිය (දෙවන සාමාජික)

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:07** 2026 වර්ෂය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව ලෙස පහත නිලධාරින් පත් කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම. ( අදාළ ප්‍රසම්පාදනයේ ස්වභාවය අනුව සාමාජික III, IV,V,VI වෙනස් වේ.)

I. එස්.එම්.සී.එස්.කේ අබේසිරිවර්ධන මයා (කමිටු සභාපති)
II. එම්.එන්.පී මුණසිංහ මයා (පළමු සාමාජික)

III. ඒ.වී.ඒ.පී ගුණරත්න මයා (විකල්ප සාමාජික)
IV. එස්.ඒ.ජී සංකල්ප පේමදාස මයා (විකල්ප සාමාජික)
V. ජී.ඩී.ඒ සේමපාල මිය (විකල්ප සාමාජික)
VI. යූ.ඩී.එන් පුෂ්පකුමාර මයා (විකල්ප සාමාජික)

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:08** 2026 වර්ෂය සඳහා භාණ්ඩ භාරගැනීමේ කමිටුව සඳහා පහත නිලධාරින් පත් කිරීමට අනුමැතිය ලබා ගැනීම.

I. එම්.එන්.පී මුණසිංහ මයා (සභාපති)
II. යූ.ඩී.එන් පුෂ්පකුමාර මයා ( සාමාජික)
III. ඒ.ඒ.පී දිසානායක මයා (සාමාජික)
IV. එස්.ඒ.ජී සංකල්ප පේමදාස මයා ( සාමාජික)

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:09** 2026 පෙබරවාරි මස දෛනික වැටුප් වෙනුවෙන් රු.1,797,839.63 ක් ගෙවීම වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් පැවසුයේ මෙම වර්ෂයේ ජනවාරි මස මහ සභාවකදී මුළු වර්ෂයටම ගෙවීම් කිරීමට අනුමැතිය ලබා ගත් බවත්, 2026 පෙබරවාරි මස දෛනික වැටුප් වෙනුවෙන් රු.1,797,839.63 ක් වැය වී ඇති බවත්, තමන් පවසා සිටින්නේ මෙලෙස අනවශ්‍ය ලෙස නාස්තිය දූෂණය නවතා ගතහොත් සංවර්ධන වැඩ කටයුතු සඳහා මුදල් ඉතිරි වන බවත්, එසේ නොමැතිව මෙය කඩාකප්පල් කිරීම වැනි කිසිදු අරමුණක් තමන්ට නොමැති බවත්, ස්ථිර සේවක මණ්ඩලය සිටියදී මෙලෙස විශාල මුදලක් නාස්ති කිරීමක් සිදු වන බැවින්

තමන් විරුද්ධ වන බවත්, මෙලෙස දෛනික වැටුප් සඳහා විශාල මුදලක් ගෙවුවද වීථි පහන් ගෙනවිත් මාස ගණනාවක් ගතවී ඇති බවත්, එය සවිකිරීමේ කටයුතු මෙතෙක් සිදු කර නොමැති බවත්, එසේම මෙහි දෛනික වැටුප් ලබන සමරදාස යන සේවකයාට දින 20ක් සඳහා වැටුප් ගෙවා ඇති බවත්, එම සේවකයා රාත්‍රියට නිදා ගැනීමට තානායමට යන බවත්, එම ස්ථානයේ ඔහුට නිදා ගැනීමේ පහසුකම් ලබා දී නිකරුනේ රු.38,000ක් ගෙවා ඇති බවත්, මෙම සභාවේ ස්ථිර කාර්යය මණ්ඩලය සිටියදී මෙහි සිටින මුරකරුවකු එම ස්ථානයට යෙදවූවානම් එම මුදල ඉතිරිවන බවත්, එම පුද්ගලයාට මත්ද්‍රව්‍ය පානය කර නිදාගෙන සිටීමට මුදලක් ගෙවනවා වැනි වැඩක් බවත්, මෙවැනි වැඩ මොනවාද යන්නත්, මේ සම්බන්ධව විධිමත්ව ක්‍රියාමාර්ග ගන්නා ලෙසත්, මේ සම්බන්ධව තමන්ගේ දැඩි විරුද්ධත්වය ප්‍රකාශ කරන බවත්, එමෙන්ම බැංකියවත්ත සණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ සේවකයන් වෙනුවෙන් රු.100ක් පඩි වැඩිකර දීගන්න බැරි වුන බවත්, අනවශ්‍ය ලෙස නාස්තිය දූෂණය සැම තැනකම තිබෙන බවත්, මේවා මේ විදියට ගියොත් ජනතාව ගහලා පන්නනු ඇති බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසුයේ සේවකයන්ගෙන් සිදුවන සේවය පිළිබඳව දැඩි අධීක්ෂණයක් සිදු කළ යුතු බවත්, එලෙස නිසි සේවයක් සිදුනොවේනම් වැටුප් ගෙවිය නොහැකි බවත්ය.

ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය ඉහත යෝජනාව සඳහා විරුද්ධ වන බැවින් බෙදීමක් ඉල්ලන බවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු උප සභාපතිතුමා පැවසුයේ දැනට කනිෂ්ඨ සේවක පුරප්පාඩු 16ක් පමණ පවතින බවත්, මෙම දෛනික වැටුප් ගෙවන සේවකයන් සමඟ ඉදිරි වර්ෂය සඳහා ගිවිසුම්ගතවීමට මෙම සභාවම අනුමැතිය ලබා දී ඇති බවත්, එබැවින් වැටුප් ගෙවිය යුතු බවත්, එබැවින් බෙදීමක් ඉල්ලා මෙය නතර කළ නොහැකි බවත්ය.

ගිවිසුම්ගතවීම සභාවේ කර්තව්‍යයක් බවත්, මේ සම්බන්ධව විනිවදභාවය නොමැතිව අධිකරණයට ගියවිට හිරේ යන්න වෙන්නේ අනුමැතිය ලබා දුන් අයට බවත්, සම්මත කර ගැනීමට අවශ්‍ය අය එය සම්මත කරගන්නා ලෙසත් විරුද්ධ වන අයට විරුද්ධ වීමට අවස්ථාව ලබා දෙන ලෙසත් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසීය.

මෙහිදී සමරදාස යන සේවකයා බීමත්ව මුර සේවයේ යෙදී සිටියදී තමන් මීට ඉහතදී සේවයෙන් ඉවත් කළ බව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී ප්‍රේමදාස මැතිතුමා සඳහන් කලේය.ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා පැවසුයේ මුර සේවය සඳහා මෙලෙස යොදවන සේවකයන්ගෙන් නිසි පරිදි රාජකාරිය සිදුවනවාද යන්න සලකා බැලිය යුතු බවත්, බස් නැවතුම්පොලේ මුරකරුවන් සිටියද එහිද කඩ කැඩීම් ආදිය සිදුවන බවත්,

මුරකරුවන්ගෙන් විමසීමේදී නොදන්නා බව ප්‍රකාශ කරන බවත්, මුරකරුට නිදාගැනීම සිදුකළ නොහැකි බවත්, ඒ සඳහා සේවා මුර දෙකක් ලබා දී ඇත්තේ එබැවින් බවත්, බස් නැවතුම්පොලේ කඩ හිමියන්ද ආරක්ෂාව නොමැති බව පවසමින් එවැනි අවස්ථාවල සභාවට පැමිණිලි කරන බවත්, ලබා දී ඇති රාජකාරිය විධිමත්ව සිදුවනවාද යන්න සභාපතිතුමා සොයාබලන ලෙසත්, වරිපනම්වලින් වැටුප් ගෙවන බැවින් සාධාරණයක් කළ යුතු බවත්ය.

ගරු සභාපතිතුමා පැවසූයේ ඉදිරියේදී එම නිසි අධීක්ෂණය සිදුකරන බවත්, එසේ වගකීම් පැහැර හරින්නේනම් ඒ සම්බන්ධව කටයුතු කරන බවත්ය.

තමන් මේ සම්බන්ධව විරුද්ධ මතයක් ප්‍රකාශ කළ බවත්, පනත ප්‍රකාරව ගරු සභාපතිතුමා එවිට මත විමසීමකට යා යුතු බවත්, ඒ අනුව පනත ප්‍රකාරව කටයුතු කරන ලෙසත්, පසුගිය සභා වාරයකදී ලේකම්තුමියද මෙය අධිභාරයක් වන කර්තව්‍යක් බව ප්‍රකාශ කළ බවත්, එබැවින් දැන දැනම අමාරුවේ වැටෙන්න බෑ යන්නත් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසූයේ මෙහිදී බෙදීමකට යාම ගැටළුවක් නොවන බවත්, දැනට මෙම ගෙවීම සිදුකර අවසන් වන ආවරණ අනුමැතිය ලබා ගත යුතු කාරණාවක් වන බැවින් එය ප්‍රායෝගික නොවන බවත්, යම්කිසි ලෙසකින් මෙම ගෙවීම් වලට විරුද්ධ වී ඒ සඳහා අනුමැතිය ලබා නොදීමේදී සේවකයන් කම්කරු නීතියට යාමක් වුවද විය හැකි බවත්ය.ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.ඒ හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූයේ එවැනි ඕනෑම තැනකට යන්න සූදානම් බවයි.

බෙදීමක් ඉල්ලා සිටින බැවින් එම බෙදීම ලබා දීම ගැටළුවක් නොවන බවත්, මෙහි සිදුවන්නේ සේවක වැටුප් ගෙවීම බවත්, ඒ වෙනුවෙන් මෙවැනි විරුද්ධ වීම් වන්නේ නම් ගිවිසුම්ගතවීමේදීම එම බඳවා ගැනීමට විරුද්ධ විය යුතු බවත්, වැටුප් ගෙවීමේදී මෙලෙස විරුද්ධ වීම අසාධාරණ බවත් ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.ඒ හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූයේ තමන් මෙම මුදල් ගෙවීම වෙනුවෙන් සභාවට පැමිණි දවසේ සිටම විරුද්ධ වූ බවත්, මෙහි සමරදාස යන පුද්ගලයාට රු.38,000ක් නිකරුනේ ගෙවීම් කරන බවත්ය.මෙහිදී එම පුද්ගලයා සභාවේ දෛනික වැටුප් ලබන එක් සේවකයෙකු පමණක් බවත්,එම චරිතය ගරු සභාපතිතුමා මැදිහත්වී ඉවත් කරන ලෙසත්, සභාවේ පුරප්පාඩු 16ක් පවතින බවත් ගරු උප සභාපතිතුමා පැවසූ අතර එම පුරප්පාඩු 16ම කම්කරු පුරප්පාඩු බවත්, සේවකයන් ඵලදායි සේවාවක් කරන බවත්, ඉහත මන්ත්‍රීතුමා පවසන ආකාරයට මෙහි කව්රුත් හොරකම් කරන්නේ නැති බවත් එතුමා වැඩිදුරටත් පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා පැවසූයේ ඉහත දෛනික වැටුප් ලෙස ගෙවීම් කර ඇති මුදල වන රු.1,797,839.63 මුදල තුළ බැංකියවත්ත ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයේ සේවකයන්ගේ වැටුප්ද අන්තර්ගත වන බවත්, මෙලෙස සිදු කිරීමෙන් බලාපොරොත්තු වන්නේ හෙට දින සිට එම සේවකයන්ගේ සේවය ලබා ගැනීම වැළැක්වීම අපේක්ෂා කරන්නේද යන්නත්ය. මෙහිදී ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාද ප්‍රකාශ කර සිටියේ මෙලෙස වැටුප් ගෙවීමට විරුද්ධ වීමෙන් බලාපොරොත්තු වන්නේ බළන්ගොඩ නගර සභාවට වැඩිම සේවාවක් කරන බැංකියවත්ත සේවකයන්ගේ වැටුප් ගෙවීම නතර කිරීම නම් එය එසේ කරමු යන්නයි.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ කොම්පෝස්ට් එකේ සේවකයන්ගේ වැටුප් ගෙවීම යන කාරණය නිසි අධීක්ෂණයක් යටතේ නිලධාරින් මඟින් පාලනය විය යුතු බවත්, තමන් මෙහි සාකච්ඡා කරන්නේ සමරදාස යන පුද්ගලයා නිකරුනේ වැටුප් රැගෙන තානායමේ නිදාගැනීම සම්බන්ධව බවත්, චරිතය කව්රු වුවත් ඔහුට වැටුප් ගෙවනු ලබන්නේ ජනතාවගේ බදු මුදලෙන් බවත්ය.

ගරු නාගරික මන්ත්‍රිනි පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය පැවසූයේ මෙහි ජ්‍යොෂ්ඨත්වයට ගරු කළද උප සභාපතිතුමා මෙහි වසර ගණනාවක් සිටියද සභාවේ මන්ත්‍රීවරයෙකු කතා කිරීමේදී ඔහුට ඇහුම්කම් දී තමාගේ කතාව කළ යුතු බවත්, මෙහිදී තමන් ඇතුළු කණ්ඩායම බෙදීමක් ඉල්ලූ බැවින් එය ලබාදෙන ලෙසත්, උප සභාපතිතුමා මෙලෙස හැසිරීම පිළිබඳ ඇත්තටම ලැජ්ජ බවත්ය.

මුළු වර්ෂයටම එකවර දෛනික වැටුප් ගෙවීම සභාවේ ආවරණ අනුමැතියට යටත්ව සිදු කිරීමට අනුමැතිය ලබා ගැනීමේදී බෙදීමකට ගොස් එය සම්මත කර ගත් බවත්, ඒ අනුව මෙය නැවත නැවත සභාවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන්නේද යන්න ගරු නාගරික මන්ත්‍රී ඩබ.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා සඳහන් කලේ ඉහත සමරදාස යන පුද්ගලයා සභාවේ රාජකාරී සඳහා යොදා නොගන්නා ලෙසයි.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් පැවසූයේ එම පුද්ගලයා හරි හෝ වැරදි විය හැකි බවත්, නමුත් එය කරන ක්‍රමවේදයක් තිබිය යුතු බවත්, අවවාදාත්මක ලිපි ලබා දී සේවය ලබා නොගන්නේ නම් එය ක්‍රම ක්‍රමයෙන් සිදු කළ යුතු බවත්, එම පුද්ගලයාද ළමයි දෙදෙනෙකු සිටින අහිංසක පුද්ගලයෙකු බවත්, ඔහු බොනවා වුවත් අහිංසක මිනිසෙකු බවත්, ඔහුගේ එම ක්‍රියාකලාපය වැරදිනම් කළ යුත්තේ අනෙත් සේවකයන්ටද ආදර්ශයක් වන පරිදි එය පෙන්වා දී නිසි අධීක්ෂණයක් සිදු කිරීම බවත්,ඉහත හර්ෂණ මන්ත්‍රීතුමාද පෙන්වා දෙන්නේ එම කාරණය බවත්ය.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා පැවසුයේ වර්ෂයේ මුල එකවර අනුමැතිය ලබා ගත්තද මාසෙන් මාසෙට ගෙවීම් අනුමත කර ගත යුතු බවත්, මුදල යොදවාගන්නා සේවකයන් ප්‍රමාණය මත තීරණය වන බවත්, මෙය තර්ක විතර්ක කිරීම නොව සාකච්ඡාවෙන් විසඳා හැකි බවත්, ඉදිරියේදී මෙවැනි දේ නොවන ලෙස නිසි අධීක්ෂණයකින් යුතුව පවත්වා ගෙන යාමෙන් ගැටළු ඇති නොවන බවත්, එම පුද්ගලයාගේ සේවය ලබා ගත්තානම් වැටුප ගෙවිය යුතු බවත්, එම පුද්ගලයා හරි හෝ වැරදි ඔහු පිළිබඳ නිසි අධීක්ෂණයක් නොමැතිකම සිදු වී ඇති බවත්, ප්‍රේමදාස හිටපු සභාපතිතුමාගේ කාලයේ ඔහු පිළිබඳව කටයුතු කිරීමේ හැකියාව පැවති බවත්, එසේ ක්‍රියාකලේනම් අද මෙසේ සිදු නොවන බවත්, එතුමාගේ උපදේශ වෙනයි ක්‍රියාකිරීම වෙනයි බවත්, එම පුද්ගලයා ඉවත් කිරීමේ තීරණයක් ගත් බවට අදවන තෙක් කිසිදු අයෙකු නොදන්නා බවත්, මේ පිළිබඳව සභාවට ඉදිරිපත් කර තීරණයක් ගත හැකිව තිබූ බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී ප්‍රේමදාස මැතිතුමා සඳහන් කලේ එතුමාගේ පාලන කාලය තුළ පුරුද්දක් ලෙස මුරකරුවන් යොදා ඇති ස්ථාන රාත්‍රියේදී නිරීක්ෂණය කිරීමක් සිදු කරන බවත්, එහිදී සමරදාස යන පුද්ගලයා කාර්යාලයේ මුරකුටියේ බීමත්ව සිටියදී සේවයෙන් ඉවත් කර එසැණින් බස් නැවතුම්පොළ මුරකරු ලෙස එදින රාත්‍රියේ සේවය කළ පියදාස යන අය කාර්යාලයේ මුරසේවය සඳහා යෙදවූ බවත්, මෙම පුද්ගලයා ආපසු දෛනික වැටුප් සඳහා බඳවා නොගන්නා ලෙස වැඩ අධිකාරි මහතා වෙත උපදෙස් ලබා දුන් බවත්ය.

ඉහත යෝජනාව පිළිබඳව ගරු සභාවේ මත කීපයක් ප්‍රකාශ වූ බැවින් ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා මේ සඳහා බෙදීමක් ලබා දෙන ලෙස යෝජනා කරන ලදී. ඉහත ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා පැවසූ කතාවට පිළිතුරු ලබා දෙමින් මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා සඳහන් කලේ එතුමා පවසන ආකාරයට බැලූ විට තමන් ඇතුළු කණ්ඩායම මෙම සභාව භාරගෙන වන්නේ මාස 06ක් පමණක් බවත්, එසේ බලන්නේ නම් මේ වන තෙක් පැවති සභාවන් වල සිටම මෙම කම්කරුවන් පැවතගෙන එන බවත්, එසේ බලන්නේ නම් සෑහෙන ප්‍රමාණයක් ඉවත් කළ යුතුව පවතින බවත්, රූමි මන්ත්‍රීතුමාලාට ඒවාත් සැලකිල්ලට ගත යුතුව පැවති බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ජේ වසන්ත ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් පැවසුයේ මීත් පෙර සභාවන් වල සිටම පැවතගෙන එන ක්‍රමවේදය පැවතියද ඒවා මෙතෙක් මතු නොවුන බවත්, හර්ෂණ මන්ත්‍රීතුමා එම කරුණු මතු කිරීමට උත්සහ දැරීම හේතුවෙන් ඒවා ඉස්මතු වි පෙනුණ බවත්,ඒ අනුව එහි බරපතලකම දැනුණ බවත්, මෙම දෛනික වැටුප් ගෙවීමට හර්ෂණ මන්ත්‍රීතුමා විරුද්ධ වීමේදී ලේකම්තුමියගෙන්ද විමසීම් කර මෙහි ඇත්ත නැත්ත සෙවූ බවත්, එයින් එතුමා පවසන කතාව 100%ක් නිවරදි බවත්, නමුත් මෙහි දැනට යම්

පටලැවිල්ලක් පවතින බවත්, එය තව තවත් බැරෑරුම් කිරීම නොව ක්‍රමක්‍රමයෙන් එම ගැටළු නිරාකරණය කර ගැනීම සිදු කළ යුතු බවත්,එම සේවකයන් සහ සභාව යන දෙකම බේරගෙන නිවරදි දේත් කළ යුතු බවත්, නමුත් හර්ෂණ මන්ත්‍රීතුමා මේ කරුණ මතු කළද මෙතෙක් එම වැරදි නිවරදි වීමක් සිදු වී නොමැති බවත්,එතුමා පවසන්නේ එය බවත්, වර්ෂය මුල මෙම දෛනික වැටුප් සඳහා බෙදීමකට ගිය අවස්ථාවේ තමන්ද විරුද්ධව ඡන්දය භාවිතා කළ බවත්,එලෙස විරුද්ධව ඡන්දය භාවිතා කලේ ලේකම්තුමියගෙන් කරුණු විමසීම් කර බවත්, මෙලෙස නැවත බෙදීමකට යාමේදී ඒ සම්බන්ධව තමන්ද අසරණ වන බවත්, එවිට එම සේවකයන්ද තමන් පිළිබඳ වෛරයක් ඇති වනු ඇති බවත්, එම කසළ සම්බන්ධ සේවය කරන සේවකයන් කරන්නේ සුවපහසු රාජකාරියක් නොවන බවත්, කුණු ගොඩවල් සමඟ පොරබදිමින් ඔවුන්ගේ ජීවිත සමඟ කරන රාජකාරියක් බවත්, මෙය නැතිකරා කියලා මෙය කරන්නේ කව්ද යන්නත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා නැවතත් අදහස් දක්වමින් පැවසුයේ තමන් මීට විරුද්ධ වූයේ සමරදාස යන පුද්ගලයාට බඩට පහර ගැසීමට නොවන බවත්, මෙහි අනුමත කාර්යමණ්ඩයක් සිටින බවත්, එම කාර්යමණ්ඩලයෙන්ම මෙය කළමණාකරණය කරගත්තානම් මෙලෙස පිටින් ශ්‍රමය මිලදී ගැනීමට වැයවන මුදල ඉතිරිවන බවත්, තමන් තර්ක කරන්නේ එයට බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා, මෙම මුරකරු ගැටළුව සඳහා හිටපු ගරු සභාපති කේ.ජී පේමදාස මැතිතුමා සිවිල් ආරක්ෂක බලකායෙන් මුරසේවය ලබා ගැනීම සඳහා යෝජනාවක් සභා සම්මත කර ගත් බවත්, එහි යාවත්කාලීන තත්වය කුමක්ද යන්නත් විමසන ලදී.

ගරු සභාපතිතුමා ඊට පිළිතුරු ලබා දෙමින් පැවසූයේ ඒ සම්බන්ධව සිවිල් ආරක්ෂක බලකාය වෙත අදාළ ඉල්ලීම යොමුකර ඇති බවත්, තවම ප්‍රතිචාරයක් නොමැති බවත්ය.ඒ සම්බන්ධ ගැටළුව වනුයේ එම ආයතනයෙන් සේවය සැපයුවද වැටුප සභාව මඟින් ගෙවීමට සිදුවීම බව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සඳහන් කලේය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා මෙහිදී දෛනික වැටුප් රු.1,797,839.63 මුදලට අදාළව කම්කරුවන් දැනට වැඩකර ඇති බැවින් එම මුදල ගෙවිය යුතු බවට තමන් අවංක ඉල්ලීමක් කරන බවත්, හර්ෂණ මන්ත්‍රීතුමා සඳහන් කරන කාරණය ඇත්ත බවත්, එතුමාගේ විරුද්ධත්වය සටහන් කර ගන්නා ලෙසත්, මෙය අවුරුදු කාලය බැවින් අහිංසක කම්කරුවෙකුගේ වැටුප නැවැත්වීම නොකළ යුතු බවත්, එසේ සිදුකළ හොත් අවසානයේ ඔවුන් සභාව සමඟ වෛර බඳින බවත්, උදාවන අලුත් අවුරුදු කාලයේදී ඔවුන්ගේ හදවත් තුළ විශාල බලාපොරොත්තුවක් පවතින බවත්, ඉදිරියේදී මෙවැනි වැරදි සිදු නොවන ලෙස

නිලධාරීන් සහ මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනා වගකීමට බැඳී මෙම කටයුතු කිරීම සුදුසු බවත්, මෙයට විරුද්ධ වීම සුදුසු නොවන බවට තමන් අදහස් කරන බවත්ය.

ඉහත ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමී මැතිතුමා පවසන දෙය තමන් පිළිගන්නා මුත් මෙම ගෙවීම දැනට ගෙවීම් කර ඇති බවත්, මහ සභා ආවරණ අනුමැතියට ඉදිරිපත් කර ඇති බවත් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසීය.

ගරු සභාපතිතුමා පැවසුයේ මෙම ගෙවීම සඳහා ආවරණ අනුමැතියට ඉදිරිපත් කර ඇති බවත්, එබැවින් ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමී මැතිතුමාද සඳහන් කළ පරිදි මේ සඳහා අනුමැතිය ලබා දී ඉදිරියේදී විධිමත් අධීක්ෂණයක් සිදු කිරීම සහ අවශ්‍ය පියවර ගැනීම සුදුසු බවත්ය.

මෙම සභාවේ දිගින් දිගටම සාකච්ඡා කරන කාරණා ඉටු නොවන බවත්, න්‍යාය පත්‍රයේ සිටම වැරදි පවතින බවත්, මේ සම්බන්ධව කණ්ඩායමක් හෝ පත්කර අධීක්ෂණයක් සිදු කරන ලෙසත්, ඉහත සාකච්ඡාවට ලක්වූ සමරදාස යන පුද්ගලයා අහිංසක පුද්ගලයෙක් බවත්,නමුත් ඔහු පිළිබඳ විධිමත් අධීක්ෂණයක් සිදු වී නොමැති බවත්,පසුගිය සභා වාරයේදී මන්ත්‍රී කණ්ඩායම සභාවේ යහසාධක සංගමය වෙත බඳවාගන්නා ලෙස යෝජනා කළද එයවත් මේ වන තෙක් සිදු වී නොමැති බවත්, සභාපතිතුමා මැදිහත් වී හෝ අදාළ අධීක්ෂණය සිදු කිරීම සුදුසු බවත් ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා බී.වීරසිංහ මැතිතුමිය පවසන ලදී.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සඳහන් කලේ ඉහත සඳහන් කරන කාරණාවලට අදාළව අධීක්ෂණයේ යම් යම් අඩුපාඩු පැවතිය හැකි බවත්, එසේම පවත්නා සේවක පුරප්පාඩු සංඛ්‍යාව අනුව බැලූ විට රු.682,000 ක් පමණ වන බවත්, එම වැටුප රජයෙන් අනිවාර්යෙන් ගෙවිය යුතු බවත්, කියන ආකාරයේ විශාල අඩුපාඩු නොව අධීක්ෂණයේ අඩුපාඩු පැවතිය හැකි බවත්, ඒවා පිළිගත යුතු බවත්ය.ගරු සභාපතිතුමා පැවසුයේ දැඩි අධීක්ෂණයකින් ඉදිරි කාලය තුළ ක්‍රියාකළ යුතු බවත්, එසේ සේවය පැහැරහැරීමක් හෝ නිසි සේවයක් සිදුනොවන සේවකයන් සම්බන්ධව ඉදිරි පියවර ලබාගන්නා බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා යන මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා මෙහිදී ඉහත යෝජනාවට විරුද්ධ වන බව පැවසූහ.ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ ඉහත යහසාධක සංගමයේ සාමාජිකත්වය මේ වන විට ඇතැම් මන්ත්‍රීතුමන්ලා ලබාගෙන ඇති බවත්, අනෙකුත් මන්ත්‍රීතුමන්ලාටද එහි සාමාජිකත්වය ලබා ගත හැකි බවත්ය.

**ඒ අනුව ඉහත යෝජනාව ගරු සභාවේ සම්මත විය.**

**07:01:10** අක්කර 18 මාර්ගයේ බෝක්කුව ඉදිකිරීමේ කර්මාන්තයට අදාළ ප්‍රසම්පාදන කටයුතු සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.ගරු සභාපතිතුමා පැවසූයේ මෙම කර්මාන්තයේ ප්‍රසම්පාදන ක්‍රමය සම්බන්ධයෙන් ගැටළුවක් මතු වූ බැවින් මෙම සභාවට ඉදිරිපත් කළ බවයි.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා මැදිහත් වී බළන්ගොඩ අක්කර 18 මාර්ගය සඳහා මිලියන 10කට වැඩි මුදලක් ලබාගෙන ඇති බවත්, මෙහිදී එම මාර්ගය සංවර්ධනය කිරිමේ කර්මාන්තයට අදාළව ඇස්තමේන්තු සකස් කරන නිලධාරියා එම මාර්ගයේ බෝක්කුව අවශ්‍ය වන ස්ථානයට එම බෝක්කුව ඇතුළත් කර නොමැතිව ඇස්තමේන්තු සකස් කර ඇති බවත්, නැවත සභාවේ මුදල් වලින් එම බෝක්කුව ඉදිකිරීමට ලක්ෂ 35ක මුදලක් වැය කිරීමට උත්සහ කරන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා වැඩිදුරටත් කරුණු පැහැදිලි කරමින්, බෝම්බුව ප්‍රදේශයේ පාරක් නඩත්තු කිරීමේදී කුඹුරක කැනීම් කටයුතු සිදු කිරීමේදී වතුර ආවා කියලා ගිවිසුම්ගත වී ඇති සමිතිය අලාභ වී ඇති බවට දැන්වූ පසු රු.56,000ක් ආරක්ෂිත ඇප තැන්පතුවෙන් ගෙවා ඇති බවත්, ඒ අනුව මෙම බෝක්කුවට අදාළ ඇස්තමේන්තුවේ එම ආරක්ෂිත ඇප තැන්පතු ආදිය නැද්ද යන්නත්, මූලික ඇස්තමේන්තුව සකස් කරන අවස්ථාවේ එය ඇතුළත් කර මුදල් ප්‍රතිපාදනය කර ගැනීම සිදු නොකර සභාවේ මුදල් ලක්ෂ 35ක් මේ වෙනුවෙන් වැය කරන බවත්, පසුව මන්ත්‍රීතුමන්ලාගේ නඩත්තුවක් කිරීමට මුදල් නොමැති බව පවසන බවත්, එමෙන්ම අක්කර 18 මාර්ගය සංවර්ධනයට විරුද්ධ වූ බව පසුව ප්‍රකාශ කරනු ඇති බවත්, නමුත් මෙම සභාවේ මුදල් නිලධාරියෙකුගේ වැරදි වසා ගැනීමට භාවිතා නොකරන ලෙසත් පවසන ලදී.

මෙහිදී ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සඳහන් කලේ මෙය ඇස්තමේන්තු සකස් කරන මූලික අදියරේදී සිදුවූ අඩුපාඩුවක් බවත්, එය සිදු නොවීමට තිබූ අඩුපාඩුවක් බවත්, ක්ෂේත්‍රයට ගියවිට එම ස්ථානයට අනිවාර්යෙන් බෝක්කුවක් අවශ්‍ය බව පෙනී යන බවත්, ඒ අනුව මෙම සංවර්ධන කාර්යය සිදු කිරීමට හැකි ආකාරය සභාවට යෝජනා කර ඇති බවත්ය.

ගරු සභාපතිතුමා සඳහන් කලේ වෙන් වී ඇති ප්‍රතිපාදන මුදල අනුව එම බෝක්කුව සමඟ සංවර්ධන කටයුත්ත කිරීමට මුදල ප්‍රමාණවත් නොවන බවත්, පසුව ක්ෂේත්‍රයට ගිය විට එම

බෝක්කුව සකස් කිරීම අනිවාර්යෙන් සිදු කළ යුතු බව පෙනී ගිය බැවින් ඒ අනුව සභා අරමුදලින් බෝක්කුව සකස් කිරීම සඳහා සභා යෝජනාවක් ඇතුළත් කළ බවත්, වෙනත් කිසිඳු ගැටළුවක් හේතුවෙන් නොවන බවත්ය.

පසුව නැවතත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ තමන් පවසා සිටින්නේ ඇස්තමේන්තු සකස් කරන අවස්ථාවේ එකී ඇස්තමේන්තු සකස් කරන  නිලධාරියා එම ස්ථානයට පාලමක් අවශ්‍යද, බෝක්කුවක් අවශ්‍යද යන්න දැනගත යුතු  වීම බවත්, ඒ අනුව එය ඇස්තමේන්තුවට ඇතුළත් කරානම් සභා අරමුදල් භාවිතා කිරීමේ අවශ්‍යතාවයක් ඇති නොවන බවත්ය.

ගරු සභාපතිතුමා ඊට පිළිතුරු ලබා දෙමින් පැවසුයේ එම කර්මාන්තය වෙනුවෙන් වෙන් වූ ප්‍රතිපාදිත මුදල නිශ්චිත මුදලක් වූ බැවින්, ඒ අනුව එම මුදලට ඇස්තමේන්තු සකස් කළ බවත්, එම පාලම සකස් කිරීම එම ඇස්තමේන්තුවට ඇතුළත් කලේ නම් එම ප්‍රතිපාදිත මුදල ප්‍රමාණවත් නොවන බවත්, එහිදී ප්‍රායෝගිකව එම ස්ථානයට පාලමක් අවශ්‍ය බව පෙනී ගිය බැවින් ඒ සඳහා සභා අනුමැතිය ලබා ගත් බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා, සභා අරමුදල් නොතිබුනේ නම් එම සංවර්ධන කටයුත්ත සිදු කරන්නේද යන වග විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසුයේ සභා අරමුදල් නොතිබුයේ නම් එය සිදු කිරීමට නොහැකි වන බවයි.

මේ සම්බන්ධව තමන්ගේ මතය ප්‍රකාශ කරන බවත්, මාස ගණනාවක් තිස්සේ තමන්ට මාර්ග නඩත්තු කර දෙන ලෙස ඉල්ලීම් පැමිණෙන බවත්, එම නඩත්තු කටයුතු වලට යෙදවීමට තිබෙන මුදල් මෙලෙස එකවර විශාල මුදලක් ලෙස යොදවන බවත්, බැංකියවත්ත කසළ අංගනයේ යන්ත්‍රයක් කැඩී දින ගණනාවක් ගත වුවද මෙතෙක් එය සාදා නොමැති බවත්, එම කටයුතු සිදු කිරීමට තිබෙන මුදල් මෙලෙස වෙනත් කාර්යයන් වලට යොදවන බවත්, මෙය මොන ආකාරයට කිව යුතුද යන්න තමාට නොතේරෙන බවත්, ගරු නාගරික මන්ත්‍රී  එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසීය.

ගරු සභාපතිතුමා පැවසූයේ මෙම කර්මාන්තයද එම ප්‍රදේශයේ ජීවත් වන ජනතාව වෙනුවෙන් සිදු කරන බවත්, එබැවින් ඒවා වෙනත් කාර්යයන් ලෙස වෙන් කළ නොහැකි බවත්, ඒ අනුව මේ සම්බන්ධව නැවත ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කළ යුතු බවත්ය.

මෙම අවස්ථාවේදී ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ඒ අනුව ඉහත අක්කර 18 මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ ප්‍රසම්පාදන ක්‍රමය වන්නේ වෙළඳපොළ මිල සැසඳුම් ක්‍රමයද යන්න විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසූයේ විරෝධතා නොවන හෙයින් වෙළඳපොළ මිල සැසඳුම් ක්‍රමය යොදා ගැනීම සුදුසු වන බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:11** කොමර්ෂල් බැංකුව අසළ පදික වේදිකාවේ වැට සකස් කිරීමේ ඇස්තමේන්තුව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා සඳහන් කලේ එතුමාගේ ධූරකාලයේදී මේ සම්බන්ධව ඇස්තමේන්තුවක් ලබා ගත් බවත්, ඒ අනුව එය සභා අනුමැතියට ඉදිරිපත් කලේද යන්නත් විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසුයේ වැඩ අධිකාරි මහතා සකස් කරන ලද ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ බවයි.

මෙම අවස්ථාවේ කරුණු සාකච්ඡා කිරීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාළ කරුණු සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා පැවසුයේ කාරක සභාවේදී සාකච්ඡා වූ කරුණු අනුව මෙහි ස්ථානයේ හිමිකාරිත්වය පිළිබඳවද සොයාබලා ඉදරි සභාවක් වෙත ඉදිරිපත් කිරීම සුදුසු වන බවයි.

**07:01:12** ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත BSF අපද්‍රව්‍ය ජෛව පරිවර්තන ව්‍යාපෘතිය ඇක්වාටෙරා ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම සමඟ නියමු ව්‍යාපෘතියක් ලෙස බැංකියවත්ත ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානය තුළ සිදු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:13** බළන්ගොඩ නගරයේ රැකියා විරහිත තරුණ තරුණියන්ට රැකියා සඳහා ප්‍රවේශ මාර්ගයක් ලෙස බළන්ගොඩ නගර සභාව සහ පුද්ගලික ආයතන එක්ව රැකියා බැංකුවක් බළන්ගොඩ නගර සභාවේ ආරම්භ කිරීමට සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:14** බළන්ගොඩ නගර සභාව විසින් ඉදිරිපත් කරනු ලබන කොන්දේසි වලට එකඟව පුද්ගලික වියදමින් මහජනපොල අංක 06 සහ 05 දරණ කඩ කාමර ඒකාබද්ධ කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස එම කඩ කාමර බදුකරු වන තෙල්ගේ දිනේෂ් කුමාර පීරිස් මහතා යොමු කර ඇති ඉල්ලීම සම්බන්ධව ඉදිරි කටයුතු තීරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන්ගේ යෝජනාවක් ලෙසට වැරදීමෙන් ඇතුළත් වී ඇති බවත් ගරු උප සභාපති නදිශාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ යෝජනාවක් ලෙස ඇතුළත් විය යුතු බවත්, ගරු සභාපතිතුමා පැවසූ අතර මෙහිදී අදහස් දැක්වූ ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ අතුරු බදු දී ඇති කඩ කාමරවල බදු අයිතිය සංශෝධනය කිරීමේ කටයුතු සඳහා අනුමැතිය මේ වන තෙක් ලැබී නොමැති බැවින් මෙම යෝජනාව මෙම අවස්ථාවේ ඉල්ලා අස්කර ගන්නා බවයි.

**07:01:15** නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කර ඇති බළන්ගොඩ නව නගර සංවර්ධන සැලසුම ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම අවස්ථාවේ නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සමඟ නව නගර සංවර්ධන සැලසුම පිළිබඳව කරුණු සාකච්ඡා කිරීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාළ සාකච්ඡාවෙන් පසු ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

මෙහිදී ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සඳහන් කලේ ඉහත සාකච්ඡාවේදී හඳුනාගත් සංශෝධන ඇතුළත් කර නව නගර සංවර්ධන සැලසුම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවයි.

ඒ අනුව සාකච්ඡා කළ දොරවෙල ඔය අසළින් ඇති පටුමඟ පළල් කර නගරයට ගමන් කළ හැකි විකල්ප මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම සහ එම මාර්ගය දෙපස කඩ හිමියන් සඳහා විකල්ප ස්ථානයක් ලබා දීම යන යෝජනාව සහ රත්නපුර මාර්ගයේ නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමේ පෞද්ගලික බස් රථ ගාලක් ඉදිකිරීමේ යෝජනාව ඉවත් කර එම ස්ථානය වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීමට යෝජනා කිරීම යන සංශෝධිත යෝජනා ඇතුළත් සංශෝධිත නව නගර සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ගෙන්වාගෙන ඉදරි සභාවක් වෙත ඉදිරිපත් කර සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**07:01:16** බලන්ගොඩ නගර සභාව මඟින් ක්‍රියාත්මක කිරිමට යෝජිත බස් රථගාල සඳහා ගාස්තු අයකිරීම පිළිබඳව තීරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා ඉහත යෝජනාව පිළිබඳව අදහස් දක්වමින් පහත පරිදි ගාස්තු අයකිරීමට යෝජනා කරන බවත්, එය සාකච්ඡා කර අවශ්‍ය සංශෝධන සිදු කර ගන්නා ලෙසත් පැවසීය.

- ලොරියක්, බස්රථයක් සඳහා රු.100.00
- වෑන් රථයක්,ජීප් රථයක් සඳහා රු.50.00
- මෝටර් රථයක්/මෝටර් කාර් රථයක් සඳහා රු.50.00
- ත්‍රීරෝද රථයක් සඳහා රු.30.00

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා පැවසුයේ ත්‍රීරෝද රථයක් සඳහා රු.50.00 ක ගාස්තුවක් අයකර අනෙකුත් සියළු වාහන සඳහා රු.100.00 ක ගාස්තුවක් අයකිරීම සුදුසු වන බවයි.ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා මෙම ස්ථානයේ බස් රථ ගාල් කිරීම සඳහා පමණක් යොදාගන්නේද යන්නත්, උදේ සිටම බස් රථ ගාල් කර තැබීමේදී අය කරන්නේ ඉහත මුදලමද යන්නත් විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසුයේ මෙම රථ ගාල සඳහා ලබා දෙන ඉඩමේ බදු කුලිය රු.75,000ක් ගෙවිය යුතු බැවින් වෙනත් වාහන සඳහාත් රථගාල් පහසුකම ලබා දීමට අපේක්ෂා කරන

බවත්, රථ ගාල් කිරීමේ වේලාව සහ අයකිරීම් ක්‍රමවේදය පිළිබඳව සාකච්ඡා කර තීරණය කිරීම සුදුසු බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී සමරසේකර මැතිතුමිය, බස්රථ වල ආරක්ෂාව වෙනුවෙන් මුරකරුවෙකු යොදවන්නේද යන්න විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසුයේ අනිවාර්යෙන් බස්රථවල ආරක්ෂාව සම්බන්ධව සැහෙන වගකීමකට බැඳෙන බවත්,ඒ වෙනුවෙන් මුරකරුවෙකු යෙදවිය යුතු බවත්ය.

මෙහි බස් රථ ගාල් කිරීම සඳහා පැය ගණන් වලට අයකරන ගාස්තුව වැඩි කළහොත් බස් රථ ගාල් කිරීම අඩුවනු ඇති බවත්, එබැවින් රු.100 ගාස්තුව වැඩි නොකර රාත්‍රී ගාල් කිරීම වෙනුවෙන් පමණක් වෙනම අයකිරීමක් ලබා ගැනීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී සමරසේකර මැතිතුමිය පැවසීය.

මෙම බස්රථගාල පවත්වාගෙන යාම සභාවෙන් සිදුකරනවාද එසේ නැතහොත් ටෙන්ඩර් කරනවාද යන්න ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා විමසන ලද අතර ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා සඳහන් කලේ දැනට බස්නැවතුම්පොලේ බස්රථ ගාල් ගාස්තු අයකිරීම සභාවෙන් සිදුකරන බවත්, එයින් දැනට සභාව දිනකට බස්රථ 170කින් පමණ ගාස්තු අයකරන බවත්, ඒ අනුව අවම රු.300,000ක පමණ මාසික අදායමක් මෙයින් ලැබීමට හැකි වනු ඇති බවත්, එබැවින් එම මුදලින් නාගරික සංවර්ධන අධිකාරියේ බදුකුලිය ගෙවිය හැකි බවත්, නමුත් ත්‍රීරෝද රථ ඇතුළු අනෙකුත් වාහන ගාල් කිරීමටත් අවස්ථාව ලබා දුනහොත් සභාවේ වාහන නැවතුම් ගාස්තු ටෙන්ඩරය ලබා ගෙන ඇති පුද්ගලයාට එය අසාධාරණයක් වනු ඇති බවත්ය.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ නාගරික සංවර්ධන අධිකාරියෙන් මේ සඳහා අනුමැතිය ලබා දී ඇත්තේ බස් රථ ගාල් කිරීමට පමණක් බවත්, එසේ නැතහොත් ඉහත සඳහන් කළ පරිදි ටෙන්ඩර්කරුට අසාධාරණයක් වනු ඇති බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා පැවසුයේ බස්රථ පමණක් ඇතුල් කිරීමට අවස්ථාව ලබා දී ආරක්ෂාව අනිවාර්යෙන් ලබා දීමට කටයුතු කළ යුතු බවත් රාත්‍රී කාලයේදී වාහන බැටරි අමතර කොටස් ආදිය සොරකම් කිරීමේ හැකියාවක් පැවතිය හැකි බවත්ය.ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී සමරසේකර මැතිතුමිය සඳහන් කලේ බස්රථ එම රථ ගාලෙන් පිට no parking පුවරු සවිකිරීම මඟින් මෙම රථ ගාල තුළටම බස්රථ ගාල් කිරීමට ලබා ගත හැකි බවත්, එමෙන්ම මෙයට වැසිකිළි පහසුකම අත්‍යවශ්‍ය බවත් එම වැසිකිළි පහසුකම් ලබා ගැනීම අයකිරීමකින් තොරව ලබා දෙන ලෙසත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ වැසිකිළි පහසුකම් සහ තාවකාලික රැඳී සිටීමේ ස්ථානයක් සකස් කිරීමට බලාපොරොත්තු වන බවයි.එසේම එතුමා වැඩිදුරටත් පැවසුයේ බස්රථ වලට

පමණක් මෙය සීමා කිරීමෙන් නගරයේ රථවාහන ගාල් කිරීමේ ගැටළුවට විසඳුමක් නොලැබෙන බවත්, එවිට නැවතත් නගරය තුළ රථවාහන ගාල් කිරීම වැඩි වන බවත්ය.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ බස් නැවතුම්පොළ තුළ ගාල් කරනු ලබන බස්රථ 170න් බස්රථ 100ක් පමණ ඇතුල් කළත් දිනකට රු.10,000ක ආදායමක් ලැබිය හැකි බවත්ය.ඒ අනුව ගරු සභාපතිතුමා පැවසුයේ මාසයක් හෝ දෙකක් මෙය ආරම්භ කර ආදායම් ප්‍රගතිය පිළිබඳව සලකා බලා දිගමට පවත්වා ගෙන යන්නේද පිළිබඳව තීරණය කළ හැකි බවයි.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා සඳහන් කලේ පොලිසිය සමඟ සම්බන්ධීකරණය වෙමින් නගරයේ වෙනත් ස්ථානවල බස්රථ නැවැත්වීම තහනම් කළ යුතු බවත්,එවිට රථගාල තුළ අනිවාර්යෙන් බස්රථ ගාල්වන බවත්, ස්ථිර වැටුප් ගෙවනු ලබන සේවකයෙකු මේ සඳහා යෙදවිය හැකි බවත්, නගරයේ දිනෙන් දින බස්රථ වැඩිවීමක් මිස අඩුවීමක් සිදු නොවන බවත්, අවශ්‍යවන්නේ මෙය ක්‍රමානුකූලව පවත්වාගෙන යාම බවත්, මෙයින් ලැබෙන සේවාව ගැන සලකා බැලිය යුතු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා මෙහිදී සිවිල් ආරක්ෂක බලකාය මඟින් මුර සේවය ලබා ගන්නේ නම් සේවා මුරයක් සඳහා රු.1600 ක් පමණ වැය වන බවත්, ඒ අනුව එම සේවය ලබා ගත්තද රථගාලෙන් ලැබෙන ආදායම මඟින් එය ආවරණය කර ගත හැකි බවත් පැවසීය.

ඒ අනුව ගරු සභාපතිතුමා පැවසුයේ මෙම බස් රථගාල තුළ බස්රථ සඳහා පමණක් ගාල් පහසුකම ලබා දීම සුදුසු බවත්, ඇතුළත් වීමේ ගාස්තුව එක් බස් රථයකින් රු.100ක ගාස්තුවක් අයකිරීමටත්, එය රථ ගාල් කර තබන වේලාව අනුව වෙනස් නොවන බවත්, රාත්‍රී ගාල් කිරීම වෙනුවෙන් වෙනම අයකිරීම කළ යුතු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා සඳහන් කලේ ඉහත ස්ථානය පස් පොළොවක් බවත්, වැහි කාලයක් වුවහොත් එය මඩ වළක් වන බවත්, භූමිය රථ ගාල වෙනුවෙන් භාවිතා කිරීමට මත්තෙන් මතුපිටට ABC යෙදීම සුදුසු වන බවත්, එසේ නැතහොත් බස් රථවලින් පැමිණෙන මඩ හේතුවෙන් බස් නැවතුම්පොළ අපිරිසිදු වන බවත්ය.

නාගරික සංවර්ධන අධිකාරිය වෙත මසකට කුලී වශයෙන් රු.90,000ක් වැනි මුදලක් ගෙවීමේදී භාවිතා කිරීමට සුදුසු තත්වයෙන් සකසා දෙන ලෙස දැනුම් දිය යුතු බවත්, එසේ නැතහොත් ඉහත ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා සඳහන් කළ පරිදි බස් නැවතුම්පොළ අපිරිසිදු වන බවත්, සභාවේ ජේ.සී.බී යන්ත්‍රය එම කටයුතු සඳහා භාවිතා

කරන්නේ නම් කුලියෙන් එම ගාස්තු අඩුකිරීම කළ යුතු බවත් ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා පැවසීය.

නාගරික සංවර්ධන අධිකාරියෙන් රු.75,000 ගාස්තුව අඩුකිරීම පිළිබඳව විමසීමක් සිදුකර මේ පිළිබඳ කටයුතු කඩිනම් කිරීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පවසන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:17** 2026.03.29 දින බළන්ගොඩ නගර සභා ක්‍රීඩාපිටිය වෙන් කර ගැනීමට ගෙවූ මුදල් ආපසු ලබා දෙන ලෙස ඒ.කේ.එන් ලූවිස් මහතා යොමුකර ඇති ඉල්ලීම අනුව එකී මුදල වන රු.5000.00 මුදල ආපසු ගෙවීමට සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් මෙම පෙර පාසල් දරුවන් සඳහාත් ක්‍රීඩා පිටිය සඳහා ගාස්තු අයකිරීමක් කරන්නේද යන්න විමසන ලදුව ගරු සභාපතිතුමන් පැවසූයේ එම ආයතනද අදායම් ලබන ආයතන බැවින් ගාස්තු අයකරන බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:18** බළන්ගොඩ නගර සභාව සතු සම්පත් පියස ගොඩනැගිල්ලේ කඩ කාමර 04ක් රජයේ තක්සේරු මත පදනම් කරගෙන වාර්ෂික බදු පදනමින් විවෘත ලංසු කැඳවීම් කර වාර්ෂික බදු පදනමින් ලබාදීමට ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලද බව පළාත් පාලන කොමසාරිස්ගේ CLG/LG-5/2/1/1(iv වෙළුම) අංක හා 2026.03.19 දිනැති ලිපිය මගින් දන්වා ඇත. ඒ අනුව එම කඩ කාමර ලංසු කැඳවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා මෙම කඩ කාමරවල තක්සේරුව ලැබී ඇත්ද යන්න විමසන ලද අතර ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා මෙම ඉඩමේ අයිතිය පිළිබඳව විමසන ලදී.ගරු සභාපතිතුමා ඊට පිළිතුරු ලබා දෙමින් තක්සේරුව ලැබී ඇති බවත්, ගරු ආණ්ඩුකාරතුමිය විසින් ඒ බව තහවුරු කරමින්

ටෙන්ඩර් කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇති බව 2026.03.17 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය මඟින් දන්වා ඇති බවත් පැවසීය.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සඳහන් කලේ මෙම කඩ කාමර 04ම ටෙන්ඩර් කරන්නේ නම් එක් කඩ කාමරයක් බදු ගත් බදුකරුවෙකු සිටින බැවින් ඒ සම්බන්ධව ඉදිරි කටයුතු කෙසේද යන්න විමසන ලදී.ගරු සභාපතිතුමා පැවසූයේ එම බදුකරු සමඟ එළඹ ඇති බදු ගිවිසුම ප්‍රකාරව කටයුතු කරන බවයි.මෙම කඩ කාමර කුමන දේ සඳහා භාවිතා කළ හැකිද යන්න ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසූයේ නිශ්චිතව එසේ කුමන දේ සඳහාද යන්න දැක්විය නොහැකි බවත් නීතිඥවරුන් විසින් නම් ඉල්ලීම් කර ඇති බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා විසින් ඉහත කඩ කාමරවල තක්සේරුව පිළිබඳව විමසන ලදුව ගරු සභාපතිතුමන් විසින් සම්පත් පියසට යාබද කඩකාමරවල මාසික වෙළඳපොළ කුළිය පිළිබඳ පහත විස්තර ඉදිරිපත් කරන ලදී.

- කඩ කාමර අංක 01 රු.6500.00
- කඩ කාමර අංක 02 සහ 03 රු.6300.00
- කඩ කාමර අංක 04,05 සහ 06 රු.5000.00

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:19** බළන්ගොඩ නගර සභාව සතු සම්පත් පියස ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ කඩ කාමර ඉදිකිරීම සඳහා සහ අනුමැතිය ලබා ගැනීම.( කීමනි මුදල ටෙන්ඩර් කිරීමේ පදනම මත)

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:20** බළන්ගොඩ නගර සභාවට අයත් කඩ කාමරවල බදු අයිතිය සංශෝධනය කිරීම සම්බන්ධයෙන් පලාත් පාලන කොමසාරිස්තුමාගේ CLG/LG/-5/3/1 – (IV වෙළුම) හා 2026.03.10 දිනැති ලිපිය අනුව අතුරු බදු ලබා දී ඇති කඩ කාමරවල බදු අයිතිය අතුරු බදුකරුගේ නමින් සංශෝධනය කර ගැනීම සඳහා බදුකරුවන් විසින් ඉල්ලීම් කර ඇති අතර ඉදිරි කටයුතු සිදු කිරීමට සහා අනුමැතිය ලබා ගැනීම.

| අනු අංකය | කඩ කාමර අංකය | ගිවිසුම්ගත බදුකරුගේ නම | අතුරු බදුකරුගේ නම |
|---|---|---|---|
| 01. | බස් නැවතුම්පොළ කඩ කාමර අංක බී-22 | අහමදු සලී කමර්දීන් | ෆලීල් මොහොමඩ් රිකාස් |
| 02. | බස් නැවතුම්පොළ කඩ කාමර අංක සී-45 | මොහොමඩ් මන්සූර් | මොහොමඩ් මසූද් |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:02** ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා

**07:02:01** කුමාරගම වසමේ පල්ලෙකුඹුර මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා එම මාර්ගය ඉතාම අබලන් තත්වයේ පවතින බව පවසන ලදුව ගරු සභාපතිතුමන් පැවසුයේ මෙම මාර්ගය ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමාගේ ප්‍රතිපාදන මත ඉදිරියේදී තාර දමා සංවර්ධනය කිරීමට යෝජනා කර ඇති බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:02:02** කුමාරගම සුසානභූමියේ ඇති සොහොන් ගෙය අළුත්වැඩියා කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා සඳහන් කලේ නගර සභා සීමාව තුළ පවත්නා මෙම ගොඩනැගිල්ල මේ වන තෙක් සභාවෙන් නඩත්තුවක් සිදු කර නොමැති බවත්, මෙම කොට්ඨාශයේ ජනතාව විසින් නඩත්තු සිදු කරගන්නා බවත්, මෙහි සොහොන් ගෙය සම්පූර්ණයෙන්ම අළුත්වැඩියා කළ

යුතු බවත්, ඒ සඳහා සභාවෙන් මුදලක් ලබා දිය හැකිනම් වැඩ අධිකාරී මහතා මඟින් ඇස්තමේන්තුවක් ලබා ගෙන එම අළුත්වැඩියාව සිදු කරගත හැකි බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා සඳහන් කලේ ඉහත ගරු මන්ත්‍රීතුමාගේ මන්ත්‍රී ප්‍රතිපාදන මඟින් මෙම අළුත්වැඩියාව සිදු කර ගත හැකි බවයි.ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා පැවසුයේ ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමාගේද කොට්ඨාශය බැවින් දායක විය හැකි බවයි.අනතුරුව ඊට පිළිතුරු ලබා දෙමින් ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා පැවසුයේ සුසාන භූමියට යන මාර්ගය නගර සභාවෙන් සකසා දුන් බවත්, තමාගේ මෙන්ම ඉහත මන්ත්‍රීතුමාගේද ගම බවත්, හිටපු සභාපති ලෙස ගමට වැඩක් කළ යුතු බවත්ය.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා නැවතත් අදහස් දක්වමින් පැවසුයේ ඉහත ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා නගර සභාවේ වැඩිපුරම වැඩ කරපු මන්ත්‍රීවරයෙකු ලෙස ඉහත නාගරික සංවර්ධන අධිකාරිය සමඟ පැවති සාකච්ඡාවේදී අනාවරණය වූ බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03** **ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

**07:03:01** දොරවෙල ගං ඉවුර පිරිසිදු කිරීම සඳහා ප්‍රජා දායකත්ව ඇතිව ශ්‍රමදානයක් පැවැත්වීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03:02** බලන්ගොඩ නගරය පිරිසිදු කිරීම සඳහා ව්‍යාපාරික ප්‍රජාව සමග එක්ව (Clean City ) වැඩසටහන ක්‍රියාත්මක කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03:03** බුලත්ගම සිරි සුනන්දාරාම විහාරාස්ථානයේ ඉදිවෙමින් පවතින චෛත්‍ය සඳහා සිමෙන්ති මිටි 50 ක් ලබාදීමට යෝජනා කරමි.( ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යටත්ව පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන මත )

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03:04** පොදුවෙළඳසැල ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනා පිළිබඳව අදහස් දැක්වූ ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ ඉහත යෝජනා අංක 07:03:01 සහ 07:03:02 පිළිබඳව එළඹෙන අලුත් අවුරුදු සමයෙන් පසුව ගරු සභාපතිතුමාගේ මූලිකත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රීතුමන්ලාගේ සාකච්ඡාවෙන් වැඩසටහක් ලෙස සංවිධානය කර ගත යුතු බවත්, 07:03:03 යෝජනාව සඳහා ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය මත පෞද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන මත සිදු කිරීමට බලාපොරොත්තු වන බවත්, 07:03:04 යෝජනාව වෙනුවෙන් අලුත් අවුරුදු සමයට පෙර පොදු වෙළඳසැළ පරිශ්‍රය නිරීක්ෂණයකට හෝ සහභාගී වී එහි පවතින අඩුපාඩු පිළිබඳව සොයා බැලිය යුතු බවත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:04 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා**

**07:04:01** බලන්ගොඩ දෙවැට පාර බෝම්බුව දක්වා මාර්ගය පුළුල් කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා ඉහත යෝජනාව පිළිබඳව අදහස් දක්වමින් පැවසුයේ ඉහත යෝජනාව නව නගර සංවර්ධන සැලැස්මේද පැවති බවත්, දැනට එම කුඹුරු වලින් අඩි 5-6 ක ප්‍රමාණය දෙන්න පොරොන්දු වී ඇති බවත්,ඒ අනුව සභාවේ

මන්ත්‍රී ප්‍රතිපාදන යොදවා හෝ බෝම්බුව පැත්තේ සිට මෙම මාර්ගය ටිකෙන් ටික හෝ සංවර්ධනය කිරීමට යෝජනා කරන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා ඉහත යෝජනාව කාලෝචිත යෝජනාවක් බවත්, ඉතා පටු මාර්ගයක් බැවින් ජනතාවට විවිධ අකටයුතුකම් සිදුවන බවත්, එමෙන්ම මෙහි ගැටළුවක් පවතින බවත්, මාර්ගය පටන් ගන්නා ස්ථානයේ ඉතාම පටු වී ඇති බවත්, මෙම සංවර්ධන කාර්යය කෙසේ හෝ සිදු කරගන්නේ නම් ජනතාවට එය වටිනා බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ දිනෙන් දින භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළ යන බැවින් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති සිදු කිරීමට අවස්ථාව ලබා දෙන ලෙසයි.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා සඳහන් කලේ සභාවට යෝජනා ලබා දුන්නද ඒවා ක්‍රියාත්මක නොවන බවත්, වැඩි දෙයක් නොව කාර්යාලයේ පිටුපස තිබෙන මාර්ගයම නිරීක්ෂණය කර බලන ලෙසත්, එම මාර්ගවල කාණු නොමැති බවත්, ඒවගේම තමාගේ කොට්ඨාශයේ මාර්ගවල කාණු සියල්ලම පාහේ විනාශවී ඇති බවත්, මෙම නඩත්තු යෝජනා සිදු කරන පිළිවෙලක් තිබිය යුතු බවත්, ටික දෙනෙකුගේ යෝජනා පමණක් ක්‍රියාත්මක වන බවත්, වරිපනම් ගෙවන ජනතාව වෙනුවෙන් මීට වඩා කැපවී වැඩ කළ යුතු බවත්, එසේ සිදු කරන බවක් පෙනෙන්නට නොමැති බවත් පවසමින් ඉදිරිපත් කරන යෝජනා ක්‍රියාත්මක නොවීම පිළිබඳව කරුණු දක්වන ලදී.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා ප්‍රකාශ කලේ ඉහත මන්ත්‍රීතුමන්ලා පවසන කාරණය අවධානය යොමු කළ යුතු කරුණක් බවත්, දිනපතා වැටුප් ගෙවීම සිදු කළද වැටුපට සරිලන ප්‍රතිඵලයක් තිබෙනවාද යන්න පිළිබඳව ගැටළුවක් පවතින බවත්, සමහර මාර්ගවල ගැටළුව වී ඇත්තේ අනවශ්‍ය ලෙස තණකොළ පාරට වැවී ඇති බවත්, මෙහි පවතින සේවක හිඟය හේතුවෙන් කිලෝමීටර් ගණනට ගෙවීම් කිරීමේ පදනම මත හෝ තණකොළ කැපීමේ කාර්යය ටෙන්ඩර් දමා මෙම නඩත්තු කටයුතු කඩිනමින් අවසන් කළ කළ යුතු බවත්ය.

ඉහත පරිදි තණකොළ කැපීමේ කාර්යය ටෙන්ඩර් දමා හෝ කඩිනම් කිරීමේ යෝජනාව ඵලදායි යෝජනාවක් බවත්, එසේම තණකොළ කැපීමේ කාර්යය සඳහා දින දෙකකට තෙල් ලීටර් 30ක් පමණ වැය වී ඇති බවත්, ඒ අනුව ඉහත යෝජනා වූ පරිදි එම කාර්යය කිරීමෙන් මුදල ඉතිරි කර ගත හැකි වනු ඇති බවත්, එසේ නොමැතිනම් වල්නාශක ගැසීම හෝ කළ හැකි බවත්, එමෙන්ම නගරයේ කාණු ගොඩ දමා සම්පත් බැංකුව අසළ මාස ගණනාවක් තිස්සේ චෛත්‍යයක් වගේ පස් ටිකක් ගොඩ ගසා ඇති බවත් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා කරුණු දක්වමින් බෝම්බුව මිරිස්කොටුව මාර්ගය නඩත්තු කිරීම පිළිබඳව සභාවට යෝජනා ඉදිරිපත් කළද එය ඉටු නොවූ බැවින් ජනතාව ඒ පිළිබඳ මහත් කනස්සල්ලෙන් සිටින බවත්, ජනතාව එකතු වී එම මාර්ගය සුද්ද කිරීමේදී තමන් එම ස්ථානයට සහභාගී නොවූ බවත්, කරව්කැටිය මාර්ගයද එසේ ජනතාව එකතු වී සුද්ද කර ගැනීම කළ බවත්, සභාවෙන් වැඩ සිදු නොවන බැවින් මෙලෙස හෝ ජනතාව තමන්ගේ ශ්‍රමදායකත්වයෙන් වැඩ සිදු කරගන්නා බවත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ ඉදිරියේදී එම කාරණා විධිමත් කර ගැනීමට බලාපොරොත්තු වන බවත්, වැඩ කොතෙක් තිබුනද ඒ සඳහා යෙදවීමට කම්කරුවන් සහ උපකරණ හිඟ ගැටළුව පවතින බවත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:05** **ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා**

**07:05:01** 2026 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස ලබාදෙන රු.500,000 මුදල, රිෂානා පෙම් පැලස් අසළ මර්සුක් මහතාගේ නිවස මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෙදවීමටත්, එම කර්මාන්තය සඳහා සභාවේ සෘජු ශ්‍රමය භාවිතා කිරීමටත් යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා පැවසුයේ ඉහත යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමාගේ මන්ත්‍රී ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවේනම් ඒ සඳහා තමන්ගේ මන්ත්‍රී ප්‍රතිපාදනද යොදා ගන්නා ලෙසයි.

ඒ අනුව එතුමාගේ එම අදහස වෙනුවෙන් ගරු සභාවේ මහත් ප්‍රසාදය හිමිවූ අතර එතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් පවසා සිටියේ එම මාර්ගය සභාවට පවරා ගැනීමට අවශ්‍ය ලිපිලේඛන සියල්ලම තමන් අදදින රැගෙන ආ බවත්, නමුත් එය මාර්ගය සංවර්ධනය කිරීමට ගැටළුවක් නොවන බවත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමාට ඉහත යෝජනාවට දායකත්වය දැක්වීම සම්බන්ධව ස්තූතිවන්ත වන බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:06 ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා**

**07:06:01** වැලිහරනාව මාර්ගයේ ළිඳ අසළින් ඉහළට ඇති මාර්ගය නඩත්තු කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා ඉහත යෝජනාව පිළිබඳ අදහස් දක්වමින් පැවසුයේ ඉහත මාර්ගයේ වලවල් හැරී ගමන් කළ නොහැකි තත්වයට පත්ව ඇති බවත්, බුද්ධ ජයන්ති මාර්ගයේද ජනතා ශ්‍රමදායකත්වයෙන් මාර්ගය නඩත්තු කිරීමක් සිදු වනු දුටු බවත්, මෙලෙස සිදුවන්නේ සභාවෙන් කළ යුතු වැඩටික නොකෙරෙන බැවින් බවත්, මෙම මාර්ගයේද අවශ්‍ය ද්‍රව්‍ය සහ කම්කරුවන් දෙදෙනෙකු ලබා දෙන්නේ නම් ප්‍රදේශවාසීන් එකතුවී එම වැඩ කොටස සඳහා සහයෝගය ලබා දෙන බවත්, ඒ අනුව පසුදින සිටම වුවද එය කිරීමේ හැකියාව පවතින බවත්ය.

ගරු සභාපතිතුමා පැවසූයේ මෙම දිනවල කර්මාන්ත අංශයේ ප්‍රිමික්ස් ඇනීමට සේවකයන් නොමැතිවීම සම්බන්ධව ගැටළුවක් පවතින බවත්, ඒ අනුව වැඩ ප්‍රමාද වෙනවා සේ පෙනෙන බවත්, ඉදිරියේදී ඒ සඳහා සියල්ලන්ම එකතු වී ක්‍රමවත් වැඩපිළිවෙලක් සකසා ගත යුතු බවත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. කාරක සභා වාර්තා සලකා බැලීම**

2026-03-12 සහ 2026-03-24 යන දිනයන්හි පැවති මුදල් කාරක සභා වාර්තා සහ 2026-03-17 දිනැති කර්මාන්ත කාරක සභා වාර්තාව මෙදින ගරු සභාවට ඉදිරිපත් කළ අතර විරෝධතා නොවූ හෙයින් එකී වාර්තා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**09. ආදායම් වියදම් වාර්තා සලකා බැලීම**

**2026 පෙබරවාරි මස ආදායම් වියදම් වාර්තාව**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | රු.15,219,766.19 |
| මූලධන ලැබීම් | රු.1,211,975.47 |
| වෙනත් ලැබීම් | රු.1,615,999.52 |

| | |
|---|---|
| මුළු ලැබීම් | රු.18,047,741.18 |
| පුනරාවර්තන වියදම් | රු.13,331,480.57 |
| ප්‍රාග්ධන වියදම් | රු.1,671,739.03 |
| වෙනත් වියදම් | රු.7,441,699.15 |
| මුළු වියදම් | රු.22,444,918.75 |

**2026 මාර්තු මස ඉන්ධන වාර්තාව**

| **2026 මාර්තු ඉන්ධන වාර්තාව** | |
|---|---|
| වාහන අංකය | මුදල (රු) |
| 226-7521 | 9090.00 |
| 227-5020 | 51939.91 |
| 56-1906 | 19519.26 |
| BC 0005 | 64020.00 |
| GC 0001 | 35970.00 |
| GK 1483 | 76369.08 |
| JD 4684 | 4359.84 |
| MM 8152 | 1990.00 |
| ND 5124 | 35206.08 |
| LL 2110 | 20872.00 |
| PF 4006 | 28638.56 |
| RC 1107 | 56373.00 |
| RC 1118 | 64850.51 |
| RD 8000 | 25160.76 |
| RD 8240 | 119575.09 |
| ZA 5039 | 25009.00 |
| DDR 0008 | 6236.00 |
| UQ 1933 | 2707.18 |
| ZA 9835 | 41904.00 |
| HF 8952 | 18180.00 |
| VI 1833 | 5569.20 |
| QL 2901 | 5688.09 |
| **TOTAL** | 719227.56 |

(ගබඩාවේ ඉතිරි ඉන්ධන ප්‍රමාණය රු.104,838.00)

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූයේ පසුගිය දින පැවති සැණකෙලියට අදාළව ප්‍රචාරක පුවරු වලින් ලද ආදායම රු.14,400ක් බව ප්‍රකාශ කළ බවත්, නමුත් 8X10 ප්‍රමාණයේ ප්‍රචාරක පුවරුවක් ප්‍රදර්ශනය කලද දිනකට රු.8000ක් ලැබිය යුතු බවත්,ඒ අනුව සැණකෙලිය පැවති දින 03 සඳහා රු.24,000ක් වත් ආදායම ලැබිය යුතු බවත්, මෙයින් පෙන්නුම් කරනුයේ නිසි කළමණාකරණයක් නොමැතිබව බවත්ය.

එතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් පැවසූයේ සභාව සතු පොලේ තොග මඩුවේ ඉඩකඩ ප්‍රමාණය බෙදීම සම්බන්ධව ගැටළුවක් පවතින බවත්, එය නිසි ක්‍රමවේදයක් මත විධිමත්ව බෙදාදීමක් සිදු කළ යුතු බවත්, එසේම පොලේ ත්‍රීරෝද රථ පොළට ඇතුල් වන මාර්ගය හරස්වන ලෙස ගාල්කරගෙන සිටින බවත්, පොල තුළට යන පාරිබෝගික ජනතාවට එය මහත් ගැටළුවක් බවත්ය.ගරු සභාපතිතුමා පැවසූයේ පොලේ තොග මඩුවේ දැල් ගැසීමේ කාර්යය සිදු කිරීමේ කටයුතු හේතුවෙන් ඉඩකඩ

බෙදීමේ කාර්යය ප්‍රමාද වූ බවත්, නමුත් එහි වැඩ නවත්වා නොමැති බවත්, කම්කරු ගැටළුව හේතුවෙන් එය තාවකාලිකව නවත්වා එම සේවකයා වෙනත් වැඩකට යෙදවීමට සිදු වූ බවත්, ඒ අනුව එම කාර්යය කඩිනමින් සිදුකරන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා සඳහන් කලේ ඉහත ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා රු.14,400ක ආදායම ලැබීම සම්බන්ධව සභාව දැනුවත් කරන ලෙසයි.

## 10. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්

### ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය මෙදින අදහස් දක්වමින් පැවසුයේ සභා වාර ගණනාවකදී තමන් බුලත්ගම සුසානභූමියේ අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු පිළිබඳව යෝජනා ඉදිරිපත් කළද එම කටයුතු මෙලෙස ප්‍රමාද වන්නේ ඇයිද යන්නත්, දිගින් දිගමට මේ ආකාරයට පැවසිය නොහැකි බවත්, එසේම බළන්ගොඩ නගර සභාවේ යහසාධක සංගමය වෙත ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා බඳවාගන්නා ලෙස යෝජනා කළද අවම වශයෙන් එම යෝජනාවත් මේ වන තෙක් ක්‍රියාත්මක කර නොමැති බවත්, මේවා පිළිබඳව සොයාබලා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලෙසත්ය.

ගරු සභාපතිතුමා පැවසූයේ බුලත්ගම සුසානභූමියේ මේ වන විට රාජ්‍ය දැව සංස්ථාව මඟින් කපා ඉවත් කිරීමට දැනුම් දී ඇති ගස් ඉතිරි වී ඇති බවත්, සභාව මට්ටමින් සිදු කළ හැකි නඩත්තු සිදුකරමින් පවතින බවත්, යහසාධක සංගමය වෙත සභාවේ මන්ත්‍රී මණ්ඩලය බඳවා ගැනීමේ කටයුතු මෙම මස සිට සිදුකරනු ඇති බවත්ය.

## 11. අවසානය

අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය, කාර්ය මණ්ඩලය සහ මාධ්‍යවේදී කණ්ඩායම සඳහා ස්තුතිය පුද කරන බව දන්වමින් මෙදින මහ සභාවේ කටයුතු ප.ව.03.05 ට පමණ අවසන් කරන ලදි.

එන්.ඩබ්.පී.ටී ජයසේන,

සභාපති,

බළන්ගොඩ නගර සභාව.